(නවවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 1(14).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2022 නොවැම්බර් 19 සෙනසුරාදා**

**2022 නොවැම්බර් 26 සෙනසුරාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

බද්දට දී ඇති පරිශ්‍රවල සන්තකය ආපසු ලබා ගැනීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(2) වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 ඔක්තෝබර් 05 දිනැති අංක 2300/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.11.17 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ඔක්තෝබර් 21 දිනැති අංක 2302/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.11.17 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— එකතු කළ අගය මත බදු පනත යටතේ නියමය,— 2005 අංක 6 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2අ වගන්තිය යටතේ එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 ඔක්තෝබර් 06 දිනැති අංක 2300/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.11.18 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියමය (අංක 1),—2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 අගෝස්තු 22 දිනැති අංක 2294/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.11.18 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියමය (අංක 2),—2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 ඔක්තෝබර් 05 දිනැති අංක 2300/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.11.18 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත යටතේ නියමය,— 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ 2 වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 ඔක්තෝබර් 12 දිනැති අංක 2301/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.11.19 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම සම්බන්ධයෙන් 2022 නොවැම්බර් 18 දින පාර්ලිමේන්තුවට පිළිගන්වන ලද ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාවේ සඳහන් මතු දැක්වෙන තත් කාරක සභා නිර්දේශ පිළිගත යුතු ය:—

**දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 121ට ඉක්බිතිවම මතු සඳහන් ස්ථාවර නියෝග දෙක 122 සහ 123 වශයෙන් නව ස්ථාවර නියෝග දෙකක් ඇතුළත් කිරීම:—**

**122 නව ස්ථාවර නියෝගය,—**

**බැංකුකරණය සහ මූල්‍ය සේවා පිළිබඳ කාරක සභාව**

(1) තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින් නොවන සාමාජික මන්ත්‍රීවරයන් දහසය දෙනෙකුගෙන් සමන්විත, බැංකුකරණය සහ මූල්‍ය සේවා පිළිබඳ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.

(2) බැංකුකරණය සහ මූල්‍ය සේවා පිළිබඳ කාරක සභාවට මතු සඳහන් බලතල තිබිය යුත්තේ ය:—

(අ) ශ්‍රී ලංකාවේ බැංකුකරණ, රක්ෂණ සහ වෙනත් මූල්‍ය ක්ෂේත්‍ර සේවාවන්හි වෘත්තීයමය ප්‍රමිතීන් සහ සංස්කෘතිය පිළිබඳව සලකා බලා වාර්තා කිරීමට;

(ආ) ගනුදෙනුකරුවන් සවිබල ගැන්වීම සහ බැංකුකරණ, රක්ෂණ සහ වෙනත් මූල්‍ය සේවා ආයතනවල ප්‍රමිතීන් ඉහල නැංවීම පිණිස ඒ මත දැඩි විනයක් ඇතිකිරීම සඳහා එම ආයතන වල ක්‍රියාකාරීත්වය සහ බහුවිධසේවා වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රතිසංස්කරණ පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමට සහ ව්‍යවස්ථාදායක සහ අනෙකුත් නියාමන ක්‍රියාමාර්ග සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට;

(ඇ) ජාත්‍යන්තර ආර්ථික ප්‍රතිපත්ති, විදේශීය මූල්‍ය සේවා නියෝග සහ ශ්‍රී ලංකාවේ මුදල් කටයුතු, ණය සහ මූල්‍ය සේවා සහ ආර්ථික වර්ධනය මත ඒවායේ බලපෑම් හා සම්බන්ධ කරුණු අංග සම්පූර්ණ පදනමකින් අධ්‍යයනය කොට සමාලෝචනය කිරීමට;

(ඈ) මහ බැංකු සංචිත පද්ධතිය, අපනයන හා විදේශීය වෙළඳ ප්‍රවර්ධනය, අපනයන පාලන ආනයන පාලන, වාණිජ, කර්මාන්ත සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය, මූල්‍ය වෙළඳපොළ, මූල්‍ය ක්‍රියාවලි, මූල්‍ය ආයතනවල කාර්ය සාධනය සහ කළමනාකරණය, මුදල් නෝට්ටු, කාසි සහ ව්‍යවහාර මුදල් නිකුත් කිරීම සහ නිදහස් කිරීම ඇතුලුව මුදල් ප්‍රතිපත්තිය හා සම්බන්ධ කරුණු සහ ණය වියපැහැදම් කිරීම සහ නැවත අය කර ගැනීම හා සම්බන්ධ කරුණු පිළිබඳව අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කිරීමට සහ මූල්‍ය ක්ෂේත්‍රයේ ස්ථාවරභාවය සහ අඛණ්ඩතාවය තහවුරු කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට;

(ඉ) ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතිකය (Sri Lanka Inter Bank Offered Rate (SLIBOR)) සකස් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් නියාමන සහ තරහකාරී විමර්ශන සිදුකිරීමට සහ ඒවා පරීක්ෂා කිරීමට;

(ඊ) රාජ්‍ය මූල්‍ය ආයතන සහ රක්ෂණය ඇතුළු සපයනු ලබන මූල්‍ය සේවාවන්ට අදාළ ආයතනික පාලනය, කාර්යසාධනය සහ කළමනාකරණය, විනිවිදභාවය මෙන්ම බැඳියාවන් අතර ගැටුම් සමාලෝචනය කිරීමට;

(උ) මූල්‍ය ප්‍රතිපත්ති සහ රක්ෂණය ඇතුළු මූල්‍ය ආයතනවලට අදාළව රජයේ සහ අනාගත රජයන්ගේ මෙන්ම පාර්ලිමේන්තුවේ වගකීම් සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සමාලෝචන සිදු කිරීමට;

(ඌ) සුරැකුම්පත් විනිමය කොමිෂන් සභාවේ කාර්යසාධනය හා කළමනාකරණය සහ ප්‍රාග්ධන වෙළඳපොළේ ප්‍රවණතාවන් පිළිබඳ විමසා වාර්තා කිරීමට; සහ

(එ) කොළඹ කොටස් වෙළඳපොළේ කාර්යසාධනය සහ කළමනාකරණය පිළිබඳ විමසා වාර්තා කිරීමට.

(3) රජය සතු යම් බැංකුවක් හෝ රක්ෂණය ඇතුළු මූල්‍ය සේවා සපයන වෙනත් ඕනෑම ආයතනයක් පිළිබඳ හෝ රජයේ ලිඛිත නීතියක් මගින් බලය පවරා ඇති වෙනත් කාර්යයක් සම්බන්ධයෙන් කටයුතු කරන ආයතනයක් සහ ඉන් පැන නගින ඕනෑම කරුණක් පිළිබඳව සිදු කරන විමර්ශනවලින් අනාවරණය වන තොරතුරු සම්බන්ධයෙන් කාරක සභාව සෑම තුන් මාසයකට වරක් පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබිය යුත්තේ ය. ප්‍රතිකාර්ය ක්‍රියාමාර්ග අවශ්‍ය කරන කරුණු සම්බන්ධ නිරීක්ෂණ සහ යම් නිර්දේශයක් තිබේ නම් එම නිර්දේශ ද එකී වාර්තාවට ඇතුළත් විය යුත්තේ ය.

(4) කාරක සභාවේ වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමෙන් පසු එය මූල්‍ය විෂය භාර අමාත්‍යවරයාට සහ අදාළ ආයතන භාර අමාත්‍යවරයන් වෙත යොමු කිරීමෙන් පසු සති අටක කාලසීමාවක් ඇතුළත එහි සඳහන් නිර්දේශ සපුරාලීමටත්, නිරීක්ෂණ සම්බන්ධයෙන් අනුගමනය කිරීමට යෝජිත ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රකාශයක් සිදු කිරීමටත්, එම අමාත්‍යවරයන් විසින් ක්‍රියා කරනු ලැබිය යුතු අතර එසේ නොමැති නම් අදාළ නිර්දේශ සපුරාලීමක් සිදු නොකළ යුතු බවට අදාළ අමාත්‍යවරයා විශ්වාස කරන්නේ නම් ලිඛිතව ඊට හේතු දක්වා එම අමාත්‍යවරයා විසින් යෝජනා කරනු ලබන විකල්ප ක්‍රියාමාර්ගය කවරේ ද යන්නත් සඳහන් කරනු ලැබිය යුතු ය. කාරක සභාවට අවශ්‍ය වන්නේ නම්, අදාළ අමාත්‍යවරයාට කරුණු පැහැදිලි කිරීම සඳහා කාරක සභාවට පෞද්ගලිකව පැමිණීමට ආරාධනාවක් කළ හැකි අතර එවැනි කාරණාවලින් පැන නඟින ප්‍රශ්නවලට සති අටක් ඇතුළත පිළිතුරු සැපයිය යුත්තේ ය.

(5) (අ) කාරක සභාවට අවශ්‍ය යැයි හැඟීයන්නේ නම් ඕනෑම ආයතනයක් පිළිබඳ සොයා බැලීම සඳහා එම කාරක සභා සාමාජික මන්ත්‍රීවරයන්ගෙන් සැදුම්ලත් අනු කාරක සභා පත් කරනු ලැබිය හැකි අතර, කාරක සභාවේ අනෙකුත් සාමාජික මන්ත්‍රීවරයන් ද එකී කවර හෝ අනු කාරක සභා රැස්වීමකට සහභාගීවීමට අපේක්ෂා කරන්නේ නම්, එම සාමාජික මන්ත්‍රීවරයන්ට ද ඊට සහභාගී විය හැකි ය. එකී අනු කාරක සභා විසින් අවශ්‍ය යැයි සලකනු ලබන ඕනෑම කරුණක් පිළිබඳව කාරක සභාව වෙත වාර්තා කරනු ලැබිය යුත්තේ ය.

(ආ) අවශ්‍ය යැයි සලකනු ලබන අවස්ථාවක දී, කාරක සභාවට හෝ කාරක සභාව විසින් පත් කරන ලද එවැනි ඕනෑම අනු කරක සභාවකට, කාරක සභාව විසින් තීරණය කරනු ලබන පරිදි පාර්ලිමේන්තු සංකීර්ණය තුළ දී හෝ අදාළ ඕනෑම ආයතනයක දී රැස්වීම් පවත්වනු ලැබිය හැකි ය.

(6) කාරක සභා සභාපතිවරයාගේ අවසරය මත කාරක සභා සාමාජික මන්ත්‍රීවරයෙකු නොවන වෙනත් ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට කාරක සභාවේ වැඩ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා අවස්ථාව ලබා දිය හැකි ය.

(7) කාරක සභාව විසින් ස්වකීය වගකීම් ඉටුකිරීමේ කාර්යය සඳහා ඕනෑම පුද්ගලයෙකු ඕනෑම අවස්ථාවකදී කාරක සභාව ඉදිරියට කැඳවීමට, ඕනෑම පුද්ගලයෙකුගෙන් ප්‍රශ්න කිරීමට සහ ඕනෑම ලිපි ලේඛනයක්, පොතක්, වාර්තාවක් හෝ වෙනත් ලේඛනයක් පිළිබඳ විභාග කිරීමටත්, ගබඩා සහ දේපළ විමර්ශනය කිරීමටත්, බැංකුකරණය සහ මූල්‍ය සේවා පිළිබඳ කාරක සභාවට හෝ එහි ඕනෑම අනු කාරක සභාවකට බලය ලැබිය යුත්තේ ය.

(8) බැංකුකරණය සහ මූල්‍ය සේවා පිළිබඳ කාරක සභාවේ ගණපූරණය සාමාජික මන්ත්‍රීවරයන් පස් දෙනෙකුගෙන් සංයුක්ත විය යුත්තේ ය. යම් සාමාජික මන්ත්‍රීවරයෙකු කාරක සභාවට පිළිගත හැකි හේතුවක් සඳහන් නොකර අනුගාමී රැස්වීම් වාර තුනකට වඩා නොපැමිණෙන්නේ නම්, එම සාමාජික මන්ත්‍රීවරයා කාරක සභා සාමාජිකත්වය අතහැර ගියා සේ සලකනු ලැබිය යුත්තේ ය.

**123** නව ස්ථාවර නියෝගය,—

### ආර්ථික ස්ථායීකරණය පිළිබඳ කාරක සභාව

(1) තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් නොවන සාමාජික මන්ත්‍රීවරයන් දහසය දෙනෙකුගෙන් සමන්විත ආර්ථික ස්ථායීකරණය පිළිබඳ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.

(2) ආර්ථික ස්ථායීකරණය පිළිබඳ කාරක සභාවේ කාර්යයන් වන්නේ:—

(අ) රජය සතු ව්‍යවසායවල කාර්ය සාධනය, කළමනාකරණය, මෙහෙයුම් කාර්යක්ෂමතාවය, ප්‍රතිපත්ති රාමුව, නෛතික රාමුව සහ අවදානම් කළමනාකරණය පරීක්ෂා කිරීම;

(ආ) රජය සතු ව්‍යවසායවල මූල්‍ය ස්ථාවරත්වය, ණය කළමනාකරණය, ලාභ සහ ආයෝජන කළමනාකරණය පරීක්ෂා කිරීම;

(ඇ) රජය සතු ව්‍යවසායවල පාඩු අවම කර ලාභ වැඩි කිරීම සඳහා අවසතුකරණය කිරීමේ අවශ්‍යතා, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව සඳහා ඇති අවස්ථා සහ උපායමාර්ග පරීක්ෂා කිරීම; සහ

(ඈ) රජය සතු ව්‍යවසායන් විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබූවන්ට අදාළව මානව සම්පත් කළමනාකරණය, අධික හෝ අතිරික්ත කාර්ය මණ්ඩලය අඩු කිරීම, වේතන හා ව්‍යවස්ථාපිත ගෙවීම් නොගෙවීම සහ වේතන සහ දීමනා වැඩිපුර ගෙවීම පිළිබඳ පරීක්ෂා කිරීමය.

(3) 1971 අංක 38 දරන මුදල් පනත සහ 2007 අංක 7 දරන සමාගම් පනත මගින් පාලනය වන කවර හෝ රජය සතු ව්‍යවසායක් පිළිබඳව කාරක සභාව විසින් හෙළිදරව් කරගනු ලැබූ කරුණු සම්බන්ධයෙන් කාරක සභාව සෑම මාස තුනකටම වරක් පාර්ලිමේන්තුවට වාර්තා කළ යුත්තේ ය.

(4) ආර්ථික ස්ථායීකරණය පිළිබඳ කාරක සභාවේ වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබූ විට, එය මුදල් විෂයය භාර අමාත්‍යවරයා සහ අදාළ ආයතන භාර අමාත්‍යවරයන් වෙත යොමු කරනු ලැබිය යුතු අතර එම අමාත්‍යවරයන් විසින් වාර්තාවේ දක්වනු ලැබ ඇති නිර්දේශ සති අටක කාලසීමාවක් තුළ ඉටු කරනු ලැබීමටත්, එම නිරීක්ෂණ සම්බන්ධයෙන් ගත යුතු යැයි එකී අමාත්‍යවරයන් විසින් යෝජනා කරනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව ප්‍රකාශයක් ඉදිරිපත් කරනු ලැබීමටත්, නැතහොත් යම් නිර්දේශයක් ඉටු නොකළ හැකිවනු ඇතැයි යන්න අදාළ අමාත්‍යවරයාගේ මතය වන්නේ නම් එයට ලිඛිතව හේතු පැහැදිලි කර එම අමාත්‍යවරයා විසින් යෝජනා කරනු ලබන විකල්ප ක්‍රියාමාර්ගය සඳහන් කරනු ලැබීමටත් කටයුතු කරනු ලැබිය යුත්තේ ය. කාරක සභාවට අවශ්‍ය වන්නේ නම්, අදාළ අමාත්‍යවරයාට කරුණු පැහැදිලි කිරීම සඳහා කාරක සභාවට පෞද්ගලිකව පැමිණීමට ආරාධනාවක් කළ හැකි අතර එවැනි කාරණා වලින් පැන නඟින ප්‍රශ්නවලට සති අටක් ඇතුළත පිළිතුරු සැපයිය යුත්තේ ය.

(5) (අ) කාරක සභාවට අවශ්‍ය යැයි හැඟීයන්නේ නම් ඕනෑම ආයතනයක් පිළිබඳ සොයා බැලීම සඳහා එම කාරක සභා සාමාජික මන්ත්‍රීවරයන්ගෙන් සැදුම්ලත් අනු කාරක සභා පත් කරනු ලැබිය හැකි අතර, කාරක සභාවේ අනෙකුත් සාමාජික මන්ත්‍රීවරයන් ද එකී කවර හෝ අනු කාරක සභා රැස්වීමකට සහභාගීවීමට අපේක්ෂා කරන්නේ නම්, එම සාමාජික මන්ත්‍රීවරයන්ට ද ඊට සහභාගී විය හැකි ය. එකී අනු කාරක සභා විසින් අවශ්‍ය යැයි සලකනු ලබන ඕනෑම කරුණක් පිළිබඳව කාරක සභාව වෙත වාර්තා කරනු ලැබිය යුත්තේ ය.

(ආ) අවශ්‍ය යැයි සලකනු ලබන අවස්ථාවක දී, කාරක සභාවට හෝ කාරක සභාව විසින් පත් කරන ලද එවැනි ඕනෑම අනු කරක සභාවකට, කාරක සභාව විසින් තීරණය කරනු ලබන පරිදි පාර්ලිමේන්තු සංකීර්ණය තුළ දී හෝ අදාළ ඕනෑම ආයතනයක දී රැස්වීම් පවත්වනු ලැබිය හැකි ය.

(6) කාරක සභා සභාපතිවරයාගේ අවසරය මත කාරක සභා සාමාජික මන්ත්‍රීවරයෙකු නොවන වෙනත් ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට කාරක සභාවේ වැඩ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා අවස්ථාව ලබා දිය හැකි ය.

(7) කාරක සභාව විසින් ස්වකීය වගකීම් ඉටුකිරීමේ කාර්යය සඳහා ඕනෑම පුද්ගලයෙකු අවස්ථාවකදී ඕනෑම පුද්ගලයෙක් කාරක සභාව ඉදිරියට කැඳවීමට, ඕනෑම පුද්ගලයෙකුගෙන් ප්‍රශ්න කිරීමට සහ ඕනෑම ලිපි ලේඛනයක්, පොතක්, වාර්තාවක් හෝ වෙනත් ලේඛනයක් පිළිබඳ විභාග කිරීමටත්, ගබඩා සහ දේපළ විමර්ශනය කිරීමටත්, ආර්ථික ස්ථායිකරණය පිළිබඳ කාරක සභාවට හෝ එහි ඕනෑම අනු කාරක සභාවකට බලය ලැබිය යුත්තේ ය.

(8) ආර්ථික ස්ථායිකරණය පිළිබඳ කාරක සභාවේ ගණපූරණය සාමාජික මන්ත්‍රීවරයන් පස් දෙනෙකුගෙන් සංයුක්ත විය යුත්තේ ය. යම් සාමාජික මන්ත්‍රීවරයෙකු කාරක සභාවට පිළිගත හැකි හේතුවක් සඳහන් නොකර කාරක සභා රැස්වීම් වාර තුනකට වඩා අඛණ්ඩව නොපැමිණෙන්නේ නම්, එම සාමාජික මන්ත්‍රීවරයා කාරක සභා සාමාජිකත්වය අතහැර ගියා සේ සලකනු ලැබිය යුත්තේ ය.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**2022 දෙසැම්බර් 09 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3/2022

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ රජයේ ව්‍යවස්ථාපිත ආයතන සඳහා අත්කර ගනු ලබන ඉඩම්වලට ගෙවිය යුතු වන්දි සහ අනෙකුත් පරිපාලන වියදම් අදාළ ආයතනය විසින් දැරිය යුතු බවත්;

(ii) එසේ වුව ද, එම ආයතනවලට මහා භාණ්ඩාගාරයෙන් වෙන් කරනු ලබන ප්‍රතිපාදන ඒ සඳහා භාවිතා කරනු ලබන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන මත ව්‍යවස්ථාපිත ආයතනවලට අත්කර ගනු ලබන පෞද්ගලික ඉඩම්, එම ආයතනවලට පැවරීමට අදාළ ක්‍රමවේදය;

(ii) ඊට අදාළ නීතිය;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන මත ව්‍යවස්ථාපිත ආයතන සඳහා අත්කර ගනු ලබන පෞද්ගලික ඉඩම්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන අනුව පැවරීමේ සහතිකයක් මඟින් එම ආයතනවලට පවරන ලෙස ඉඩම් අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීය ලේකම්වරුන්ට උපදෙස් දී ඇති බවත්;

(ii) එසේ උපදෙස් ලබා දීම, ඉහත පනතේ විධිවිධානවලට, ඉඩම් නියෝගවලට සහ චක්‍රලේඛවලට පටහැනි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) එසේ නම්, මෙම තත්ත්වය නිවැරදි කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

33/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බුද්ධිමය දේපළ ආරක්ෂා කිරීම සඳහා නව නීති සම්පාදනය කිරීමට හා මේ වනවිට පවතින නීති සංශෝධනය කිරීමට කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, එම නව නීති හා සංශෝධනය කරන ලද නීති වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඒ හේතුවෙන් නිර්මාණකරුවන්ට අත්වන වාසි හා ආරක්ෂාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2018.01.01 සිට 2021.01.01 දක්වා කාලය තුළ බුද්ධිමය දේපළ අවභාවිතා කිරීම සම්බන්ධයෙන් වැරදිකරුවන් වූ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් පුද්ගලයාට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

300/2022

ගරු නිතීඥ වසන්ත යාපාබණ්ඩාර මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහවැලි ගඟ ආශ්‍රිතව වැලි ගොඩැමීම හේතුවෙන් එම ගංගාවේ සාමාන්‍ය ගමන් මාර්ගය අවහිර වී ඇති බවත්;

(ii) ගඟ දෙපස ඉවුරුවල ගොඩගසා ඇති වැලි ගොඩවල් හේතුවෙන් සාමාන්‍ය වර්ෂාවකදී පවා ගංවතුර ඇතිවීමේ ප්‍රවණතාවයක් ඇති බවත්;

(iii) එම වැලි ගොඩවල් පේරාදෙණිය-ගන්නෝරුව යුද හමුදා කඳවුර හා ගැටඹේ රාජෝපවනාරාම විහාරස්ථානය අසල විශාල ප්‍රදේශයක් පුරා පැතිර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (iii) හි සඳහන් වැලි ආශ්‍රිත ප්‍රදේශය ඵලදායී ආර්ථික කටයුත්තක් වෙනුවෙන් භාවිතා කරන්නේද;

(ii) නොඑසේ නම්, එසේ භාවිතා කිරීම සඳහා සැලසුම් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

347/2022

ගරු හේෂා විතානගේ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රජයේ හා පෞද්ගලික රෝහල්වල වාර්ෂික සේලයින් අවශ්‍යතාවය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට සේලයින් නිෂ්පාදනය කරනු ලබන ආයතන ශ්‍රී ලංකාවේ ස්ථාපිත කර තිබේද;

(iii) සේලයින් ආනයනය සඳහා වර්ෂයකට වැය කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ සේලයින් නිෂ්පාදනය කරනු ලබන්නේ නම්, එම ප්‍රමාණය ශ්‍රී ලංකාවේ වාර්ෂික සේලයින් අවශ්‍යතාවයෙන් කොපමණද;

(ii) එම නිෂ්පාදන ධාරිතාවය ඉහළ නැංවීම සඳහා මේ වනවිට වැඩපිළිවෙළක් තිබේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iv) ශ්‍රී ලංකාවේ සේලයින් නිෂ්පාදනය නොකරන්නේ නම්, සේලයින් නිෂ්පාදනය ආරම්භ කිරීම සඳහා වැඩපිළිවෙළක් තිබේද;

(v) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

674/2022

ගරු කිංස් නෙල්සන් මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හිඟුරක්ගොඩ ඇතුළු ප්‍රදේශ රැසක ජීවත්වන පවුල් විශාල සංඛ්‍යාවක් විසිතුරු මල් වගා කිරීමේ නිරත වන බවත්;

(ii) එම වගාකරුවන්ට අවශ්‍ය පස් ලබා ගැනීමේ දුෂ්කරතා සහ මල් සඳහා ස්ථාවර මිලක් නොමැති වීම හේතුවෙන් ඔවුන් ගැටලු රැසකට මුහුණ දී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහත සඳහන් ගැටලු විසඳීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

970/2022

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ බුලත් වගාව බහුලව සිදු කරනු ලබන බවත්;

(ii) බුලත් සඳහා ඉල්ලුම ඉහළ මට්ටමක පැවතියද බුලත්වල විකුණුම් මිල පහළ මට්ටමක පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) බුලත්වල විකුණුම් මිල ඉහළ නැංවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පුදුකුඩිඉරුප්පු - බටහිර සහ කිරාන්කුලම් වැනි ගම්මානවල ජීවත් වන ජනතාවගෙන් 30% ක් පමණ සිය ජීවනෝපාය ලෙස කජු වගාව සිදු කරනු ලබන බවත්;

(ii) ග්‍රාමීය සංවර්ධන සම්බන්ධීකරණ ව්‍යාපෘතිය යටතේ එම ජනතාවට පළාත් සභාව මඟින් ප්‍රතිපාදන වෙන් කර ඇති නමුත් මේ දක්වා එම ප්‍රතිපාදන ලබා දී නොමැති බවත්;

යන්නත් එතුමා දන්නෙහිද?

(ඈ) (i) එම ප්‍රතිපාදන ලබා නොදීමට හේතුව කවරේද;

(ii) එම ප්‍රතිපාදන ලබා දීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1107/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහ බැංකු බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවක් පත් කරන ලද දිනය කවරේද;

(ii) එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති නිර්දේශ කවරේද;

(iii) එම බැඳුම්කර වංචාවට සෘජුවම සම්බන්ධ පුද්ගලයන්ගේ නම් කවරේද;

(iv) එම බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් මේ දක්වා ගෙන ඇති ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1514/2022

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2018 පළාත් පාලන මැතිවරණය පැවැත්වීමට පෙර පළාත් පාලන ආයතනවල සභිකයන් ලෙස කටයුතු කරන ලද ක්ෂේත්‍ර නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් නිලධාරියා සේවය කරන ලද ආයතනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඔවුන් අතරින් සභාපති/උප සභාපති/නගරාධිපති/උප නගරාධිපති ලෙස කටයුතු කරන ලද සංඛ්‍යාව හා එම පළාත් පාලන ආයතන කවරේද;

(iv) ඉහත (i) හි සඳහන් නිලධාරීන් අතරින් පළාත් පාලන ආයතනවල සභිකයන් ලෙස කටයුතු කරන ලද සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සහ කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන් අතරින් සභාපති/උප සභාපති/නගරාධිපති/උප නගරාධිපති ලෙස කටයුතු කරන ලද සංඛ්‍යාව හා එම පළාත් පාලන ආයතන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ක්ෂේත්‍ර නිලධාරීන්ට මැතිවරණයට ඉදිරිපත් වීම තහනම් කරමින් එවකට රජය ගෙන ආ නීති හේතුවෙන් (අ)(iv)හි සඳහන් නිලධාරීන්ට අසාධාරණයක් සිදු වූ බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එය නිවැරදි කිරීමට ගනු ලබන පියවර කවරේද;

(iii) ඊට අදාළ පනත සංශෝධනය කිරීමට කටයුතු කරන්නේද;

(iv) එම දිනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1531/2022

ගරු ඉෂාක් රහුමාන් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කලාවැව මගින් පෝෂණය වන මහවැලි-එච් කලාපයේ පිහිටා ඇති වැව් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් වැව් විධිමත් පරිදි නඩත්තු නොකිරීම හේතුවෙන් ජලජ ශාකවලින් පිරී ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් වී වගාවේ නිරත ගොවීන් දැඩි අසීරුතාවලට පත්වී ඇති බවත්;

(iii) එම වැව් ආශ්‍රිතව ධීවර කටයුතු සිදු කරනු ලබන ධීවරයන්ගේ රැකියා අහිමිවීමේ තර්ජනයකට ලක් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) ඉහත සඳහන් ගොවීන් හා ධීවරයින් පත්ව ඇති දුෂ්කරතා සැලකිල්ලට ගෙන එම වැව් පිළිසකර කිරීමට කටයුතු කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1675/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ ගම්මාන අතරින් මේ වනවිට වාරි ජල ගැටලුවට මුහුණ දී ඇති ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගම්මානවල නම් කවරේද;

(iii) මාතලේ දිස්ත්‍රික්කයේ වාරි ජල ගැටලුව විසඳීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1898/2022

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා විදේශ රැකියාවල නිරතව සිටියදී මරණයට පත් වූ, රෝගී වූ හා අනතුරුවලට ලක්වූ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ අතරින් රක්ෂණ වන්දි සඳහා හිමිකම් ලැබූ හා නොලැබූ ශ්‍රමිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රක්ෂණ වන්දි සඳහා හිමිකම් ලැබූ ශ්‍රමිකයන්ට ගෙවන ලද මුළු මුදල කොපමණද;

(iv) රක්ෂණ වන්දි සඳහා හිමිකම් නොලැබූ ශ්‍රමිකයන් වෙනුවෙන් යම් ප්‍රතිලාභයක් ලබා දීමට පියවර ගෙන තිබේද;

(v) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2003/2022

ගරු ජේ.සී. අලවතුවල මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් පදිංචිය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජනතාවට බෙදා දී ඇති එක් එක් ඉඩමේ නම, ඉඩමේ ප්‍රමාණය, ඉඩමට අයත් කට්ටි ප්‍රමාණය, ඉඩම් කට්ටි බෙදා දුන් දිනය, පිහිටා ඇති ගමේ නම, ග්‍රාම නිලධාරි වසමේ නම සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත සඳහන් ඉඩම් කට්ටි සඳහා ඔප්පු ලබා දීමට කටයුතු කර තිබේද;

(iii) නොඑසේ නම්, එම ඉඩම් සඳහා ඔප්පු ලබා දීමට අපේක්ෂිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ඉඩම් කට්ටි බෙදා දීමේදී මුදල් අය කරන්නේද;

(ii) එසේ නම්, එසේ මුදල් අය කරනු ලබන පදනම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2044/2022

ගරු වේලු කුමාර් මහතා, — වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(ආ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු වතු ඉඩම්වල, කිරි ගොවිපළ පිහිටුවීමට 2021.09.06 දින අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන තිබේද;

(ii) ඒ සඳහා "ගලබොඩ" සහ "මවුන්ට් ජීන්" යන එක් එක් වත්තෙන් ලබා ගනු ලබන ඉඩම් අක්කර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් ලබා ගනු ලබන එක් එක් සමාගමේ නම, එම එක් එක් සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ නම් සහ එම එක් එක් අධ්‍යක්ෂවරයාගේ ජාතිකත්වය (ස්වදේශිකද/විදේශිකද) වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත එක් එක් සමාගම විසින් ගෙවනු ලබන අත්තිකාරම් මුදල සහ ඉඩම් අක්කරයක වාර්ෂික බදු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත වතු පිහිටා ඇති දිස්ත්‍රික්කවල ඇති රජයේ කිරි ගොවිපළ සතුව ප්‍රමාණවත් ඉඩම් තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, ඉහත ඉඩම්, කිරි ගොවිපළ සඳහා ලබා දීමේ පදනම කවරේද;

(iii) එම කිරි ගොවිපළ පිහිටුවීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2061/2022

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ තුන්වැනි අදියර ආරම්භ කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා වැය කරනු ලබන මුදල කොපමණද;

(iii) එම අරමුදල් සපයා ගනු ලබන මූලාශ්‍රය කවරේද;

(iv) ඒ යටතේ සිදු කිරීමට අපේක්ෂිත විදුලිබල උත්පාදනය මෙගාවොට් කොපමණද;

(v) මෙම ව්‍යාපෘතිය සඳහා ටෙන්ඩර් කැඳවීමක් සිදු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2173/2022

ගරු රෝහණ බංඩාර මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම් සහ ණය දෙන සමිතියේ මේ වනවිට සිටින සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමිතියේ මේ වනවිට ඇති වත්කම් ප්‍රමාණය කොපමණද;

(iii) එම සමිතියේ සාමාජිකයන්ගේ මුදල් එහි පාලනාධිකාරිය විසින් අවභාවිතා කරන බවට ලංකා ගුරු සංගමය ඇතුළු සංගම් විසින් චෝදනා කරන බව දන්නේද;

(iv) එම අවභාවිතා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2521/2022

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 ජනවාරි මාසයේ සිට 2019 නොවැම්බර් දක්වා ආරක්ෂක මණ්ඩල රැස්වීම් පවත්වා ඇති දින සංඛ්‍යාව කවරේද;

(ii) එම රැස්වීම් සඳහා සහභාගිවූවන්ගේ නම් කවරේද;

(iii) ආරක්ෂක මණ්ඩල රැස්වීම් සඳහා නීත්‍යානුකූලව සහභාගිවීමට හිමිකම ඇති දේශපාලනඥයන් සහ නිලධාරින් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පැවති සම්ප්‍රදාය බිඳ හෙළමින් ඉහත කාලසීමාව තුළදී, විවිධ පුද්ගලයන් ආරක්ෂක මණ්ඩල රැස්වීම්වලට සහභාගි වී ඇති බව පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේදී හෙළිදරව් වී ඇති බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2536/2022

ගරු නීතිඥ මධුර විතානගේ මහතා,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා වකුගඩු අරමුදලේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධි ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදුවිය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2554/2022

ගරු කුමාරසිරි රත්නායක මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ජාතික ආරක්ෂක විද්‍යායතනයේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධි ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2568/2022

ගරු සංජීව එදිරිමාන්න මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගර්භනී මව්වරුන් හා ළදරුවන් සඳහා අවශ්‍ය ත්‍රිපෝෂ මේ වනවිට නිකුත් කරනු ලබන්නේද;

(ii) ජා-ඇල කපුවත්ත, ස්ථාපිත කර ඇති ත්‍රිපෝෂ කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු අඛණ්ඩව සිදු කරන්නේද;

(iii) ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය දේශීය වශයෙන් සපයා ගනු ලබන්නේද ;

(iv) නොඑසේ නම්, ආනයනය කරන්නේද;

(v) ආනයනය කරන්නේ නම්, වර්ෂ 2015 සිට මේ දක්වා ආනයනය කර ඇති අමුද්‍රව්‍ය ප්‍රමාණය සහ ඒ වෙනුවෙන් වැය කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2591/2022

ගරු තිස්ස අත්තනායක මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ, නැගෙනහිර ප්‍රාදේශිකයේ, ප්‍රධාන ප්‍රාදේශීය කාර්යාලය කල්මුණේ ප්‍රදේශයේ ගොඩනැගිල්ලක කුලී පදනම මත පවත්වාගෙන යනු ලබන බවත්;

(ii) එම කාර්යාලය ස්ථාපිත කිරීමට සුදුසු ඉඩමක් මඩකලපුව ප්‍රදේශයෙන් වෙන්කර දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i)හි සඳහන් ගොඩනැගිල්ල කුලී පදනම මත ලබා ගන්නා ලද වර්ෂය කවරේද;

(ii) ඒ සඳහා අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටිය කවරේද;

(iii) ගොඩනැගිල්ලෙහි මාසික කුලී මුදල සහ එය කුලී පදනම මත ලබා ගන්නා ලද දින සිට මේ දක්වා ගෙවන ලද මුළු කුලී මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත (අ) (ii)හි සඳහන් ඉඩම, ඉහත සඳහන් කාර්යය සඳහා වෙන් කරන ලද වර්ෂය කවරේද;

(ii) එම ඉඩමේ අදාළ ගොඩනැගිල්ල ඉදිකිරීම ප්‍රමාදවීමට හේතු වූ කරුණු කවරේද;

(iii) එම ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධයෙන් ඉදිරි සැලසුම් කවරේද;

(iv) මෙම කාර්යාලය ස්ථාපිත කිරීමේදී, මඩකලපුව දිස්ත්‍රික්කය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2605/2022

ගරු අශෝක් අබේසිංහ මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යටත්විජිතභාවයෙන් නිදහස් වීමෙන් පසු ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සෘණ අගයක් වාර්තා කරන ලද වර්ෂ කවරේද;

(ii) එම එක් එක් වර්ෂයේ ආර්ථික වර්ධනය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් වර්ෂයේ මුදල් අමාත්‍ය ධුරයේ සහ ජනාධිපති ධුරයේ කටයුතු කරන ලද පුද්ගලයන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත සඳහන් වර්ෂවල ශ්‍රී ලංකාවේ ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීමට එවකට පැවති රජයන් විසින් ක්‍රියාමාර්ග ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2625/2022

ගරු ඩී. වීරසිංහ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට පවතින පිරිවෙන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පිරිවෙන්වල අධ්‍යාපනය ලබන ගිහි සහ පැවිදි සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පිරිවෙන්වල සේවය කරනු ලබන අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත පිරිවෙන්වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා 2022 වර්ෂයට වෙන් කරන ලද ප්‍රතිපාදනය කොපමණද;

(ii) නව පිරිවෙන් ආරම්භ කිරීම සඳහා සැලසුම් කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2633/2022

ගරු සම්පත් අතුකෝරළ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යල සහ මහ කන්න සඳහා අවශ්‍ය පොහොර ඉදිරියේදී අඛණ්ඩව සැපයීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(ii) බීජ වී හිඟයකින් තොරව ලබා දීමට කටයුතු කරන්නේද;

(iii) විවිධ මිල ගණන් යටතේ මේ වනවිට බීජ වී අලෙවි කරනු ලබන බව දන්නේද;

(iv) බීජ වී මිල පාලනය කිරීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විවිධ මිල ගණන් යටතේ වල් නාශක හා පළිබෝධ නාශක අලෙවි කරනු ලබන බව දන්නේද;

(ii) වල් නාශක හා පළිබෝධ නාශක මිල පාලනය කිරීම සඳහා වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

(iii) ඒවා සහන මිලට ලබා දීම සඳහා මේ වනවිට රජය මැදිහත් වී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2641/2022

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කර්මාන්තශාලාවලින් සහ වෙනත් ඉදිකිරීම්වලින් බහුල වශයෙන් ගංගාවලට අපද්‍රව්‍ය බැහැර කරන බවත්;

(ii) සමහර ඉදිකිරීම් සඳහා නිසි අධ්‍යනයකින් තොරව පරිසර බලපත්‍ර නිකුත් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ගංගාවලට අපද්‍රව්‍ය බැහැර කරන කර්මාන්තශාලා/ආයතන දැනුම්වත් කර එලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම වැළැක්වීමට පියවර ගන්නේද;

(ii) ගංගාවලට අපද්‍රව්‍ය බැහැර කරන බවට මේ වනවිට හඳුනාගෙන ඇති කර්මාන්තශාලා/ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) එම කර්මාන්තශාලා/ආයතනවලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2646/2022

ගරු ගාමිණී වලේබොඩ මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දශක කිහිපයකට ඉහත ශ්‍රී ලංකාවේ මිනිස් ජනාවාස සහ වගාබිම් බවට පත්ව තිබූ භූමි, පසු කාලීනව රක්ෂිත වනාන්තර බවට පත් කර ගැසට් කර ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් එම ප්‍රදේශවල ජීවත් වූ ජනතාව පීඩාවට පත් වී ඇති බවත්;

(iii) එම ජනතාවගේ ගැටලු සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම පිණිස ක්‍රමවේදයක් සකස් කළ යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ගැසට් කිරීම හේතුවෙන් මේ වනවිට වාර්තා වී ඇති ගැටලු සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගැටලු විසඳීම සඳහා මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

(iii) ඉදිරියේදී එවැනි ගැටලු ඇති නොවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2652/2022

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රජයේ රෝහල්වල මේ වනවිට සේවය කරනු ලබන හෙද නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(ii) රජයේ හෙද සේවයේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iii) එම පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2662/2022

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සිටින ආබාධිත පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් වෙනුවෙන් ලබා දෙනු ලබන මාසික දීමනාව සඳහා වැය කරනු ලබන මුදල කොපමණද;

(iii) පුද්ගලයන්ට සහ පවුල් ඒකක සඳහා ලබා දෙනු ලබන දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) දීමනා ලබා ගැනීම සඳහා පොරොත්තු ලේඛනවල සිටින ආබාධිත පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2690/2022

ගරු වාසුදේව නානායක්කාර මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවට වාහන ආනයනය කිරීම තහනම් කර ඇති නමුත් 2022 පෙබරවාරි 22 වනවිට ලැම්බෝගිනි වර්ගයේ වාහන 01ක්, රෝල්ස් රොයිස් වර්ගයේ වාහන 01ක් සහ හැමර් වර්ගයේ වාහන 02ක් රේගුව දක්වා ගෙනවිත් තිබේද;

(ii) එම වාහනවල වෙළඳපළ වටිනාකම රුපියල් කෝටි 57ක් හෝ ඊට ආසන්න අගයක් බව දන්නේද;

(iii) ශ්‍රී ලංකා රේගුව විසින් රුපියල් ලක්ෂ 750 - 800 අතර වටිනාකමකට එම වාහන නිදහස් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම නිදහස් කිරීම නීති විරෝධී බවත්;

(ii) එමගින් රජයට විශාල මූල්‍ය අලාභයක් සිදු වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2724/2022

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සීමාසහිත සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆයිනෑන්ස් (Central Investment and Finance PLC -CIFL) නමින් වූ මූල්‍ය ආයතනයක් සඳහා ව්‍යාපාරික කටයුතු සිදු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසරයක් ලබා දී තිබුණේද;

(ii) එම ආයතනය විසින් සිය තැන්පත්කරුවන්ගේ මුදල් නැවත ඔවුන්ට ගෙවා නොමැති බව දන්නේද;

(iii) එම ආයතනය බුන්වත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරීක්ෂණයක් සිදු කරනු ලැබුවේද;

(iv) එම පරීක්ෂණ වාර්තාවේ නිර්දේශ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) ඉහත තැන්පත්කරුවන්ගේ මුදල් නැවත ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2887/2022

ගරු මායාදුන්න චින්තක අමල් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කල්පිටිය අර්ධද්වීපයේ දෙළුම් වගා කරනු ලබන බව දන්නේද;

(ii) එසේ නම්, එහි දෙළුම් වගා කර ඇති භූමි ප්‍රමාණය කොපමණද;

(iii) කල්පිටිය අර්ධද්වීපයේ දෙළුම් වගා කරනු ලබන ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ගොවීන්ට නිසි පරිදි තාක්ෂණික දැනුම නොලැබීම හා නිෂ්පාදන අලෙවි කර ගැනීමේ බාධා පවතින බව දන්නේද;

(v) ඒවා විසඳීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2981/2022

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත විවිධ සේවා සමූපකාර සමිති සතු ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ඉන්ධන පිරවුම්හල පිහිටි ප්‍රදේශය කවරේද;

(iii) සීමාසහිත විවිධ සේවා සමූපකාර සමිතිවලට නව ඉන්ධන පිරවුම්හල් පිහිටුවීම සඳහා අවසර ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3087/2022

ගරු තිසකුට්ටි ආරච්චි මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවෙන් මේ වනවිට ණය ලබා ගෙන ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත ආයතනයෙන් ණය ලබා ගැනීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම් කවරේද;

(iii) එම ආයතනයේ ණය වෙනුවෙන් අය කරනු ලබන වාර්ෂික පොලී අනුපාතය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වනනෙහිද?

(ආ) (i) නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවෙන් ණය ලබා ගෙන මේ වනවිට ණය ගෙවීම පැහැරහැර ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) දැඩි ආර්ථික අපහසුතා ඇති පුද්ගලයන් සඳහා ණය සහන ලබා දීමේ හැකියාවක් තිබේද;

(iii) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3117/2022

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සිටින විදුලි පාරිභෝගිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා විදුලි (පෞද්.) සමාගම විසින් විදුලි සම්බන්ධතාවය ලබා දී ඇති පාරිභෝගිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වනවිට විදුලි සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා ඉල්ලුම්කර ඇති ඉල්ලුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ඉල්ලුම්කරුවන් සඳහා විදුලි සම්බන්ධතාවය ලබා දීමට ලංකා විදුලිබල මණ්ඩලයට හැකියාව තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3156/2022

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට වාර්ෂිකව ආනයනය කරනු ලබන ප්ලාස්ටික් කොසු, ප්ලාස්ටික් ඉදල් හා පිරිසිදු කිරීමට යොදා ගනු ලබන ප්ලාස්ටික් බුරුසු ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒවා ආනයනය කිරීම සඳහා වාර්ෂිකව වැය කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කොහු ආශ්‍රිත භාණ්ඩ භාවිතය දිරිගැන්වීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) කොහු ආශ්‍රිත භාණ්ඩ සඳහා වන ආදේශක භාණ්ඩ ආනයනය අධෛර්යමත් කිරීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3165/2022

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ සේවකයන්ගේ උසස්වීම් හා වැටුප් වර්ධක ලබාගැනීම සඳහා ඔවුන් කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් විය යුතු බවත්;

(ii) 2022 වර්ෂයේ ජනවාරි මස සිට කාර්යක්ෂමතා කඩඉම් විභාග නොපැවැත්වීම හේතුවෙන් ඔවුන්ගේ උසස්වීම් හා වැටුප් වර්ධක ලැබී නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, එම කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3171/2022

ගරු මයන්ත දිසානායක මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා මහනුවර, මාතලේ සහ නුවරඑළිය යන දිස්ත්‍රික්කවල පවතින අධි අවදානම් නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාසවල පදිංචිකරුවන් වෙනත් ස්ථානවල පදිංචි කරවීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(iii) ඔවුන්ට ලබා දෙනු ලබන ප්‍රතිලාභ ප්‍රමාණවත් නොවන බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3208/2022

ගරු මිලාන් ජයතිලක මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නව කැලණි පාලමේ සිට අතුරුගිරිය දක්වා කුළුනු මත ඉදිකරනු ලබන අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු මේ වනවිට ආරම්භ කර තිබේද;

(ii) නොඑසේ නම්, ඊට අදාළ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

(iii) එම මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම සඳහා ගත වන කාලය කොපමණද;

(iv) එම මාර්ගයේ වැඩ අවසන් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ගය ඉදිකිරීමට අදාළ මිනුම් කටයුතු අවසන් කර තිබේද;

(ii) මාර්ගය ඉදිකිරීම හේතුවෙන් ඉඩම් අහිමි වන පුද්ගලයන්ට වන්දි ගෙවීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3218/2022

ගරු සුදත් මංජුල මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීම සඳහා ලියාපදිංචි වී ඇති ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතන වර්ගීකරණය කර තිබේද;

(iii) එසේ නම්, එම වර්ගීකරණ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ප්‍රමිතියෙන් තොර ඉදිකිරීම් සිදු කරනු ලබන ආයතන සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(ii) මේ වනවිට, අසාධු ලේඛනගත කර තිබෙන ඉදිකිරීම් ආයතන සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3234/2022

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උපාධිධාරීන් සඳහා රජයේ රැකියා ලබා දීමේ වැඩසටහනේ දෙවන අදියර යටතේ 2019 වර්ෂයේදී රැකියා ලබා දෙන ලද සියලුම උපාධිධාරී අභ්‍යාසලාභීන් සඳහා මේ වනවිට ස්ථිර පත්වීම් ලබාදී තිබේද;

(ii) එසේ නම්, ඔවුන් ස්ථිර කරනු ලැබූ දිනය කවරේද;

(iii) ඔවුන්ගේ එක් වසරක පුහුණු කාල සීමාව අවසන් වූ දිනය කවරේද;

(iv) ඔවුන්ගේ පුහුණු කාල සීමාවට අදාළ හිඟ වැටුප් ලබා දීම සහ සේවා කාලය ගණනය කිරීම සිදු කරනු ලබන්නේ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3262/2022

ගරු මර්ජාන් ෆලීල් මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බේරුවල සිට හික්කඩුව දක්වා වූ මුහුදු තීරය ආශ්‍රිත සංචාරක කර්මාන්තය මේ වනවිට අඩාල වී ඇති බව දන්නේද;

(ii) එම මුහුදු තීරය ආශ්‍රිත සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සංචාරක හෝටල් හිමිකරුවන් ලබා ගෙන ඇති ණය සම්බන්ධයෙන් සහන ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) සංචාරක කර්මාන්තය නගා සිටුවීම සඳහා ආරම්භ කර ඇති ව්‍යාපෘති කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3267/2022

ගරු දිලිප් වෙදආරච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදගම ග්‍රාම නිලධාරි වසමේ පිහිටා ඇති "යායවත්ත" නැමැති ඉඩමේ විශාලත්වය අක්කරවලින් කොපමණද;

(ii) ඉහත ඉඩම සම්බන්ධයෙන් 1979.04.09 වන දින ගොනු කර, විභාග කරන ලද අංක P 1935 දරන නඩුවේ තීන්දුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2004 වර්ෂයේ සිදු වූ සුනාමි ව්‍යසනයෙන් අවතැන්වූවන් සඳහා නිවාස ඉදිකිරීමට ඉහත ඉඩමෙන් පවරා ගන්නා ලද ඉඩම් කොටසේ විශාලත්වය කොපමණද;

(ii) එම ප්‍රමාණයෙන් සුසාන භූමිය සඳහා වෙන් කර ඇති ඉඩම් කොටසේ විශාලත්වය කොපමණද;

(iii) සුසාන භූමිය සඳහා වෙන් කිරීමෙන් පසු ඉතිරි ඉඩම් කොටසේ විශාලත්වය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3318/2022

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වතු සමාගම් සතුව වගා නොකරන ලද ඉඩම් විශාල ප්‍රමාණයක් පවතින බව දන්නේද;

(ii) එසේ නම්, එම වගා නොකරන ලද ඉඩම් ප්‍රමාණය, එක් එක් පළාත අනුව අක්කරවලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වතු සමාගම් සතු දීර්ඝ කාලයක සිට වගා නොකරන ලද ඉඩම්, රත්නපුර දිස්ත්‍රික්කයේ ගොඩකවෙල, ඕපනායක සහ වැලිගෙපොල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පවතින බව දන්නේද;

(iv) එම වගා නොකරන ලද ඉඩම් ප්‍රමාණය, ඉහත සඳහන් එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව අක්කරවලින් වෙන් වෙන් කොපමණද;

(v) වගා කිරීම සඳහා එම ඉඩම් ජනතාවට ලබා දීමට ක්‍රමවේදයක් තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3335/2022

ගරු දයාසිරි ජයසේකර මහතා,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට විදේශ රැකියා සඳහා ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් ඉල්ලුම් කරනු ලබන රටවල් කවරේද;

(ii) එම එක් එක් රට විසින් ශ්‍රී ලංකාවට ලබා දෙන බවට දන්වා ඇති රැකියා අවස්ථා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විදේශ රැකියා සඳහා භාෂා සහතික අවශ්‍ය රටවල් කවරේද;

(ii) වලංගු වෘත්තීය පුහුණු සහතික අවශ්‍ය රටවල් කවරේද;

(iii) භාෂා සහතික සහ වෘත්තීය පුහුණු සහතික අවශ්‍ය නොවන රටවල් තිබේද;

(iv) එසේ නම්, එම රටවල් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) විදේශ රැකියා සඳහා ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් යොමු කිරීමට මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

(ii) ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට විදේශ රැකියා සඳහා අවශ්‍ය සුදුසුකම්, කඩිනමින් සපුරාලීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3370/2022

ගරු වාල්ස් නිර්මලනාදන් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු පළාත තුළ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් ඩිපෝ 7ක් ස්ථාපිත කර තිබුණද, එම ඩිපෝවල පවතින බස්රථ හිඟය හා සේවක මණ්ඩලවල පවතින පුරප්පාඩු හේතුවෙන් පළාතේ මහජනතාව වෙත නිසි සේවයක් ලබා දීමට නොහැකි වී ඇති බවත්,

(ii) ඒ හේතුවෙන් රාජ්‍ය සේවකයන්ට, ගුරුවරුන්ට හා පාසල් සිසුන්ට නියමිත වේලාවට අදාළ ආයතන වෙත යාමට නොහැකි වී ඇති බවත්.

(iii) ඇතැම් ගමනාන්ත වෙත ප්‍රවාහන සේවාවන් නොමැතිවීම හේතුවෙන් අධික මුදලක් වැය කරමින් ප්‍රවාහන අවශ්‍යතා සපුරා ගැනීමට සිදු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ඉදිරියේදී උතුරු පළාතේ මහජනතාව වෙත ගුණාත්මක ප්‍රවාහන සේවාවක් ලබා දීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3578/2022

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත ශ්‍රී ලංකන් එයාර් ලයින් ආයතනය විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවීමට ඇති හිඟ මුදල කොපමණද;

(ii) එම මුදල් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අය කර දීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3581/2022

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ලංකා විදුලිබල මණ්ඩලයට අයවිය යුතුව ඇති හිඟ බිල්පත්වල වටිනාකම කොපමණද;

(ii) ප්‍රසිද්ධ හා බලවත් පුද්ගලයන් විසින් විදුලි බිල්පත් ගෙවීම පැහැරහැර තිබෙන බව දන්නේද;

(iii) ඔවුන්ගෙන් අයවිය යුතු හිඟ මුදල් අයකර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3662/2022

ගරු යදාමිණී ගුණවර්ධන මහතා,— තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය සම්බන්ධයෙන් ජාතික නිර්වචනයක් සකස් කර තිබේද;

(ii) එසේ නම්, එම නිර්වචනය කවරේද;

(iii) නොඑසේ නම්, එම නිර්වචනය සකස් කිරීම සඳහා අවශ්‍ය කරනු ලබන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ සාක්ෂරතා අගයන් ජාතික, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටම අනුව වෙන් වෙන් වශයෙන් ලබා දිය හැකිද;

(ii) නොඑසේ නම්, තොරතුරු තාක්ෂණ සාක්ෂරතා අගයන් ඉහත එක් එක් මට්ටම අනුව මැනිය හැකි ක්‍රමවේදයක් සකස් කළ හැකි ආකාරය කවරේද;

(iii) තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය ඉහළ නැංවීම සඳහා මේ වනවිට වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වන්නේද;

(iv) නොඑසේ නම්, තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය ඉහළ නැංවීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3852/2022

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ තුනක පමණ කාලයක සිට කොලොන්නාව, සේදවත්ත, සිද්ධාර්ථ විද්‍යාලයේ ක්‍රීඩාංගණයේ පස් ගොඩ ගසා තිබීම හේතුවෙන් එම ක්‍රීඩාංගණය ඉහත විද්‍යාලයේ සිසුන්ට ක්‍රීඩා කටයුතු සඳහා භාවිතා කිරීමට නොහැකි තත්ත්වයක පවතින බව දන්නේද;

(ii) එම ක්‍රීඩාංගණය ක්‍රීඩා කටයුතු සඳහා භාවිතා කළ හැකි වන පරිදි සකස් කිරීම මේ වනතෙක් ප්‍රමාද වීමට හේතු කවරේද;

(iii) එම ක්‍රීඩාංගණය පිළිසකර කර සිසුන්ට නැවත ක්‍රීඩා කටයුතුවලට භාවිතා කිරීම සඳහා ලබා දෙනු ලබන දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3866/2022

ගරු ඉම්තියාස් බාකීර් මාකර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ, දෙමළ මාධ්‍ය ජාතික පාසල් සංඛ්‍යාව සහ පළාත් පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් පාසලේ නම, එම පාසල අයත්වන අධ්‍යාපන කලාපය, පාසලට අදාළ වර්ගීකරණය, පවතින ශ්‍රේණි අනුව ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3911/2022

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සහනදායී කුලී පදනම මත රජයේ සේවකයන්ට නිවාස ලබා ගැනීමට අවස්ථාවක් තිබේ නම්, එය ඔවුන්ට විශාල සහනයක් බව පිළිගන්නේද;

(ii) කොළඹ හා තදාසන්න ප්‍රදේශවල පිහිටා ඇති රජයේ ආයතනවල සේවය කරනු ලබන රජයේ නිලධාරින් සඳහා ප්‍රවාහන පහසුකම් සහිත ප්‍රදේශවල සහනදායී කුලී පදනම මත ලබා ගත හැකි නිවාස යෝජනා ක්‍රමයක් ඉදිකිරීමට සැලසුම් කරන්නේද;

(iii) එසේ නම්, ගම්පහ දිස්ත්‍රික්කය සඳහා එවැනි නිවාස යෝජනා ක්‍රමයක් සැලසුම් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?